DOI : 10.31357/fhssmst.2015.00640

# අපයෝජිත ළමයින් අපරාධ යුක්ති ක්‍රියාවලියෙහිදී මුහුණ දෙනු ලබන ගැටලු

**ලි.ප. අං.** 1805552011007

සපර්යේෂණ ශාස්ත්‍රපති (අපරාධ විද්‍යාව) උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙත ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධය

24 FEB 2015

පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
නුගේගොඩ.

මෙම පර්යේෂණ නිබන්ධය ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර මහතාගේ සුපරීක්ෂණය යටතේ මා විසින් සම්පාදනය කළ බවත්, මෙ පර්යේෂණයේ කොටස් වශයෙන් හෝ සම්පූර්ණ වශයෙන් හෝ වෙනත් විශ්ව විද්‍යාලයකට හෝ ආයතනයකට හෝ වෙනත් උපාධියක් හෝ ඩිප්ලෝමාවක් සඳහා ඉදිරිපත් නොකරන ලද බව සහතික කරමි.

එම්.ඒ එච්.එන් ප්‍රියකාන්ත

ලි.ප.අං : 1805552011007

මේ අපේක්ෂකයා විසින් කරන ලද ප්‍රකාශය සත්‍ය බවත්, මේ නිබන්ධනයේ ඇගයීම් කාර්ය සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීමට සුදුසු බවත් නිර්දේශ කරමු.

............................................ ............................................

සුපරීක්ෂකතුමාගේ අත්සන අධ්‍යයනාංශ ප්‍රධානතුමාගේ අත්සන

# පටුන

## පළමු පරිච්ඡේදය

**පර්යේෂණ විග්‍රහය**


1. මාතෘකාව හැඳින්වීම ------------------------------------------- ------- 01-10

1.2 අධ්‍යයනයේ අරමුණු ------------------------------------------------- 10

1.3 අධ්‍යයනයේ වැදගත්කම ---------------------------------------------- 10 -11

1·4 පර්යේෂණ ගැටලුව ------------------------------------------------- 11-12

1.5 අධ්‍යයන ක්ෂේත්‍රය ------------------------------------------------- 12-16

1.6 නියැදිය ------------------------------------------------------------ 17-18

1.7 අධ්‍යයන සීමා ------------------------------------------------------ 18

1.8 පර්යේෂණ ක්‍රමවේදය ----------------------------------------------- 19 -20

1.8 දත්ත විශ්ලේෂණය ------------------------------------------ -------- 21


## දෙවන පරිච්ඡේදය


2.1 ළමයා පිළිබඳ නිර්වචන ------------------------------------------ 22-26

2.2 එක්සත් ජාතින්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ---------- 26-29

2·3 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ 182 වන සම්මුතිය ------------ 29-33

2.4 ළමා අයිතිවාසිකම් වලට බලපාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය -------- 33 -34

2.5 ළමා අපයෝජනය යනු කුමක්ද? -------------------------------------- 34- 36

2.6 ලොව වෙසෙන ළමයින්ගේ තත්වය -------------------------------- 36 -54

2.7 ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනයන් හඳුනා ගනිමු -------------------- 55 -70

2.8 ළමා අයිතිවාසිකම් හා අපරාධ නීතිය --------------------------------- 71 -79

2.9 අපරාධ යුක්ති ක්‍රියාවලිය හඳුනා ගැනීම ------------------------------- 79 -87

2.10 අපරාධ යුක්ති ක්‍රියාවලියට අයත් ආයතන හඳුනා ගැනීම ------------ 87 -101

2.11 ළමයින් අපයෝජනයන්ගෙන් ආරක්ෂා කරන නීති ------------------ 102 -137

## තුන්වන පරිච්ඡේදය

3.1 ළමා අපයෝජන සම්බන්ධ අපරාධ යුක්ති ක්‍රියාවලියේ ක්‍රියාත්මක භාවය --- 138 -149

3.2 මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීම ---------------------------------- 149 -151

3.3 හඳුනා ගැනීමේ පෙරෙට්ටුව ---------------------------------------------- 152 -154

3.4 වෛද්‍ය පරීක්ෂණයට යොමු කිරීම -------------------------------------- 154 -155

3.5 විශේෂඥ වාර්තා පිළිගැනීම ------------------------------------------ 155

3.6 විශේෂඥ සහාය ලබා ගැනීම ------------------------------------------ 156 -157

3.7 ලඝු නොවන නඩු නීති උපදෙස් සඳහා යොමු කිරීම -------------------- 157 -159

3.8 සාක්ෂියක් යනු කුමක්ද? ------------------------------------------ 159 -163

3.9 අපයෝජිත ළමයෙකුගෙන් සාක්ෂි ලබා ගැනීම -------------------------- 164 -173

3.10 සාක්ෂි විමසීම ----------------------------------------------------- 173 - 175

3.11 අපයෝජිත ළමයෙකු සම්බන්ධ වැදගත් අවස්ථා ----------------------- 175 -182

## හතරවන පරිච්ඡේදය

4.1 මූලික තොරතුරු විශ්ලේෂණය කිරීම ------------------------------- 183 - 199

4.2 අපයෝජිත ළමයා අපරාධ යුක්ති ක්‍රියාවලියෙහිදී මුහුණ දෙන ගැටලු-- 199 -219

4.3 අපරාධ යුක්ති ක්‍රියාවලියේ ආයතනගත ගැටලු-------------------------- 219 -237

4.4 ළමා අපයෝජන නීතියේ පවත්නා ගැටලු------------------------------ 237 -251

## පස්වන පරිච්ඡේදය

### හඳුනාගත් ගැටලු සඳහා යෝජනා

5.1 පොදු යෝජනා ------------------------------------------------------------ 252 -259

5.2 ළමා අපයෝජන නීති ගැටලු සඳහා යෝජනා ---------------------- 260- 263

5.3 ආයතනගත ගැටලු සඳහා යෝජනා --------------------------------- 263 -266

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

## ස්තුතිය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සපර්යේෂණ ශාස්ත්‍රපති උපාධි අධ්‍යයනය අවශ්‍යතාවය සඳහා ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධනය ''අපයෝජිත ළමයින් අපරාධ යුක්ති ක්‍රියාවලියෙහිදී මුහුණ දෙනු ලබන ගැටලු'' යන මාතෘකාව යටතේ ඉදිරිපත් කරනු ලබන්නේ ඉතා සතුටිනි.

මෙම පර්යේෂණය සඳහා සහය දක්වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයනාංශයේ ලේඛකාධිකාරීතුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය පිරිනමමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ, මානව හා අපරාධ විද්‍යා අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රනීත් අභයසුන්දර ගුරුපියාණන් මා හට නිවැරදි මඟ පෙන්වීම් ලබා දෙමින් මාගේ සුපරීක්ෂකවරයා ලෙස මා හට දක් වූ සහය කෘතවේදීව සිහිපත් කරන අතර අධ්‍යයනාංශ ප්‍රධාන මහචාර්ය ජයසුන්දර ගුරුපියාණන් ද මෙහි දී ගෞරවණීයව සිහිපත් කරමි.

වාචික පර්යේෂණයේ දී මා අධීක්ෂණය කරමින් සාර්ථක පර්යේෂණ නිබන්ධයක් සකස් කිරීම සඳහා මා මෙහෙය වූ රුහුණු විශ්වවිද්‍යාලයේ මහාචාර්ය සරත් අමරසිංහ ගුරුපියාණන්ටත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්ය දයා අමරසේකර ගුරු පියාණන්ටත් මාගේ ගෞරවණීය ස්තුතිය පිරිනමමි.

පර්යේෂණය සඳහා තොරතුරු ලබා ගැනීමේ දී සහය වූ බලපිටිය මහ අධිකරණ විනිසුරුතුමා, බලපිටිය හා ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණවල ගරු විනිසුරුතුමන්ලා සහකාර මණ්ඩලය, ඇල්පිටිය ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිතුමා ඇතුළු ස්ථාන භාර පොලිස් නිළධාරීන්, ළමා නිවාස පාලක පාලිකාවන් සහ මා හට සහය දක් වූ සියලු රාජ්‍ය ආයතන නිළධාරින් සෙනෙහෙබරව සිහිපත් කරමි.

පර්යේෂණ නිබන්ධය පිටපත් කර ගැනීම සඳහා මා හට අත් උදව් දුන් මාගේ මිතුරු මිතුරියන් ද කෘතවේදීව සිහිපත් කරමි.

එමෙන්ම මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම සඳහා මා දිරිමත් කරමින් මා හට ශක්තියක් වූ ආදරණීය බිරිඳට ද, ආදරණීය ස්තුතිය පිරිනමමි.

# අපයෝජිත ළමයින් අපරාධ යුක්ති ක්‍රියාවලියේදී මුහුණපාන ගැටලු

## (බලපිටිය මහාධිකරණ කලාපය ඇසුරින්)

එම්.ඒ.එච්.එන් ප්‍රියකාන්ත

## නිබන්ධන සාරාංශය

ලොව සියළු දේ ළමයා වෙනුවෙන් බව ලෝක ළමා දින වැනි අවස්ථා වලදී පෙන්වා දෙයි. ළමයාගේ ආරක්ෂාව වෙනුවෙන්, ලොව සෑම රටක්ම විවිධ පියවර ගෙන තිබේ. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා තම නීති පද්ධතිය ශක්තිමත් කර ඇත. ශ්‍රී ලංකාව තුළ ද ළමා නීතිය 1990 දශකයේ සිට විවිධ සංශෝධනයන්ට ලක් කර ඇති අතර, නව නීති හඳුන්වා දී ඇත. කෙසේ නමුත් ලෝකයේත්, ලංකාවේත් ළමා අපයෝජන සිදුවීම් වාර්තා වීමේ අඩුවීමක් හෝ පාලනයක් දක්නට නොවේ.

අපයෝජිත ළමයින් වෙනුවෙන් යුක්තිය, සාධාරණය ඉටු කිරීම, අපයෝජකයාට දඬුවම් කිරීම හා ඒ තුළින් සමාජයට යම් පණිවිඩයක් ලබා දීම අපරාධ යුක්ති ක්‍රියාවලියේ මූලික පරමාර්ථ ලෙස සරලව හඳුනාගත හැකිය. නමුත් පොදුවේ ගත් කළ ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති ක්‍රියාවලිය යම් යම් විවේචන වලට ලක්වන අවස්ථා ද ඇත. සමාජයේ අපරාධ වැඩි වීම් සම්බන්ධයෙන් අපරාධ යුක්ති ක්‍රියාවලිය ද ඉවහල් වන්නේයැයි විවේචන පවතියි. ළමා අපයෝජන වර්ධනය කෙරේ, ළමා අපයෝජන නීතිය, අපරාධ යුක්ති ක්‍රියාවලියට අයත් ආයතනගත ගැටලු හා නිළධාරීන් සම්බන්ධ ගැටලු ආදිය මෙයට හේතු ලෙස පෙන්වා දෙයි.

මෙම පර්යේෂණයට භාජනය වන්නේ, අපයෝජිත ළමයින් වෙත අපරාධ යුක්ති ක්‍රියාවලිය කරනු ලබන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමයි. අපයෝජිත ළමයෙක් යනු ආරක්ෂාව, රැකවරණය, ආදරය අත්‍යවශ්‍යය අවස්ථාවක පසුවන ළමයෙකි. ළමයාගේ අසරණකම, නොදැනුවත්කම, දුප්පත්කම, ප්‍රයෝජනයට ගෙන ඔවුන් කායික, මානසික හා ලිංගිකමය වශයෙන් අපයෝජනයට ලක් කරන සමාජයක අපරාධ යුක්ති ක්‍රියාවලිය තුළින් ද ඔවුන්ට සාධාරණයක් ලබා දෙන්නේදැයි අධ්‍යයනය කිරීම මෙහි අපේක්ෂාව වෙයි. එමෙන්ම ළමා අපයෝජන නීතිය පිළිබඳව අධ්‍යයනය කිරීම හා නීතියේ හා ආයතනගත කාර්යභාරයන් තුළින් අපයෝජිත ළමයින්ට කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම මෙහිලා අපේක්ෂිතයි.

මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදා ගනු ලැබුවේ බලපිටිය මහාධිකරණ කලාපයයි. ලංකාවේ සෙසු අධිකරණ කලාපයන් හා සැසඳීමේදී, අපරාධ සිදුවීම් බහුල අධිකරණ කලාපයක් ලෙස මෙම කලාපය හඳුනාගත හැකිය. මෙම අධිකරණ කලාපයට බලපිටිය හා ඇල්පිටිය මහේස්ත්‍රාත් අධිකරණ කලාප අයත් වේ. එම මහේස්ත්‍රාත් අධිකරණ

දෙකට වාර්තා වන ලඝු නොවන නඩු වල මූලික විමර්ශනයෙන් පසුව අධි චෝදනා මත, නඩු විභාගයට ගන්නේ බලපිටිය මහාධිකරණයේය. ළමා අපයෝජන වාර්තාවීම් අතරින්ද මෙම කලාපය කැපී පෙනෙයි. මහේස්ත්‍රාත් අධිකරණ දෙකට වාර්තා වන නඩු අතරින් නඩු 25 බැගින් නඩු 50ක්ද, බලපිටිය මහාධිකරණයේ දැනට විභාග වන නඩු අතරින් නඩු 50ක්ද අහඹු ලෙස තෝරා ගෙන ඒවා අධ්‍යයනය මගින්අපරාධ යුක්ති ක්‍රමයේ ගැටලු අධ්‍යයනය කර ඇත. එමෙන්ම අපයෝජිත ළමයින් 50 දෙනෙක් (ළමා නිවාසගත) හා එදිනෙදා නඩු දින වලට පැමිණෙන ළමයින් 15ක්ද, ළමා අපයෝජන නඩු වලදී රාජකාරිමය වශයෙන් සම්බන්ධ වන නිළධාරීන් 50 දෙනෙක්ද මෙම අධ්‍යයනයේ දත්ත දායකයන් ලෙස යොදා ගනියි. අපරාධ යුක්ති ක්‍රියාවලියේදි අපයෝජිත ළමයින් මුහුණ දෙනු ලබන ගැටලු පිළිබඳව විධිමත්ව කර ඇති අධ්‍යයනයක් මෙතෙක් දක්නට නොලැබෙයි. එබැවින් මෙම පර්යේෂණය අපරාධ යුක්ති ක්‍රියාවලිය හා වර්තමාන ළමා නීතිය, ළමා නීතිය හා සම්බන්ධව කටයුතු කරන ආයතනවල ඇති කරනු ලබන සංශෝධනයන් හා වන සැළසුම් සකස් කිරීමේදී මනා මගපෙන්වීමක්ද සපයනු ඇත.

# පළමු පරිච්ඡේදය

# අපයෝජිත ළමයින් අපරාධ යුක්ති ක්‍රියාවලියෙහිදී මුහුණ දෙනු ලබන ගැටලු

## 1.1 හැඳින්වීම

ලෝකය ඉදිරියට ගෙන යන නියමුවන් වන්නේ ළමා පරපුරයි. අද දිනයේ ලොව දකින දරුවා හෙට දිනයේ ලෝකය මෙහෙයවන වැඩිහිටියෙක් බවට පත් වෙයි. ඔහු යහපත් පෞරුෂයකින් යුක්ත වූ, විචාරශීලී මිනිසෙක් බවට පත් කිරීම වැඩිහිටි පරපුරේ වගකීමකි. ඒ සඳහා ළමයාගේ සියළු අයිතිවාසිකම් තහවුරු වන ආකාරයේ ජීවත් වීමට සුදුසු සමාජයක් සකස් කර දීම අත්‍යවශ්‍ය කරුණකි. මෙහිදි ළමා අයිතිවාසිකම් මොනවාද යන්න නිවැරදිව හඳුනා ගැනීම, ඒවා නීතිගත කිරීම, ළමා අයිතිවාසිකම් කඩ කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම, නීතිය ක්‍රියාත්මක කිරීමේ විධිමත් ආයතන පද්ධතියක් ඇති කිරීම හා එහි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම හා ළමා සුභ සාධනය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වෙයි.

ළමයා යනු කවරෙක් ද යන්න පැහැදිලි කර ගැනීම මෙහිදී වැදගත් වෙයි. ළමා අයිතිවාසිකම් පිළිබඳව දක්වා ඇති 1989 එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ගත් සම්මුතියේ (Convention of the right of child) පළමු වන වගන්තියේ ළමයෙක් යනු කවරෙක්දැයි දක්වා ඇත. එනම් ළමයෙක් යනු එම ළමයාට අදාල නීතිය යටතේ වයස අවුරුදු 18ට පෙර, ඔහු වයෝ පූර්ණත්වය ලබන්නේ නම් මිස, වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙක්ම අදහස් වෙයි.(ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය-1989,1993,02)

මෙම අර්ථ දැක්වීම තුළ යම් සංකීර්ණතාවක් ඇත. මෙහි දක්වා ඇති පරිදි කිසියම් නීතියක් මගින් වයස අවුරුදු 18 ලැබීමට පෙර, ළමයා වයස් පූර්ණත්වයක් ලැබීමට ඉඩ තිබේයැයි යන කොන්දේසියයි. මෙමගින් පැහැදිලි වන්නේ කිසියම් රටක හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත්

නීතියක් මගින් වයස අවුරුදු 18 ලැබීමට පෙර කවර හෝ වයස් සීමාවක දී ළමා විය පිළිබඳ වයස් කාණ්ඩය ඉක්මවා යන්නේ නම්, එම පුද්ගලයා නිතැතින්ම අදාල නීතිය හා සම්බන්ධ පසුබිම තුළ වැඩිහිටි පුද්ගලයෙක් බවට පත් වන බවයි.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිවල වයස අවුරුදු 8, 10, 12, 14, 16 සහ 18 වශයෙන් ළමයින්ගේ වයස් මට්ටම් සඳහන්ව තිබේ. එවැනි ළමයෙකුට එරෙහිව සිදු කරනු ලද වරදක් සම්බන්ධයෙන් කටයුතු කරන විට එම ප්‍රශ්න ගත වරද නිර්වචනය කරන නීතියේ වයස් මට්ටම කුමන ආකාරයෙන් දක්වා තිබේද යන්න පිළිබඳව විමසිලිමත් විය යුතුයි.(ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව,1995,05)

ළමා අපයෝජනය ලෝකයේ මෙන්ම ශ්‍රී ලාංකික ජන සමාජය තුළ පැන නැගී ඇති සංකීර්ණ සමාජ ගැටලුවකි. සෑම වසරකම ලෝකයේ මිලියන 10ක් පමණ වූ සංඛ්‍යාවක් (වයස අවු.5න් පහළ) මිය යති. මිලියන 150ක් පමණ ළමයින් ජීවත් වීමට නිවසක් නොමැතිව වීදි වල ජීවත් වෙයි. මිලියන 246ක පමණ ළමයින් සංඛ්‍යාවක් ලිංගික සූරාකෑම් වලට ගොදුරු වෙයි. මිලියනයකට අධික ළමයින් සංඛ්‍යාවක් ලිංගික කර්මාන්තයෙහි යොදවා ඇත. ලක්ෂ 03ක පමණ ළමයින් යුද්ධය නිසා මිය යයි. එබැවින් වර්තමානයේ ළමයින් පිළිබඳ වඩාත් අවධානය යොමු කළ යුතු කාල පර්ච්ඡේදයක් බවට පත්ව ඇත.(පෙරේරා,2005,35)

මේ අයුරින් සලකා බැලීමේ දි පෙනී යන්නේ ළමයින් විවිධ අවස්ථාවල විවිද අයුරින් කායික, මානසික හා ලිංගික වශයෙන් අපයෝජනයන්ට ලක් වෙන බවයි. ළමා අපයෝජනය, අතීතයේ සිටම පැවති බවට විවිධ සාහිත්‍යමය සාක්ෂි පවතියි. ශ්‍රී ලංකාවේ ද ළමා අපයෝජන සම්බන්ධයෙන් ඉතිහාසගත තොරතුරු වාර්තා වේ. ඒ පිළිබඳ තොරතුරු විවිධ පොත පතින් ලබා ගත හැකිය. ප්‍රභූ රදල පංතිය පමණක් නොව රජතුමා ඇතුළු රාජ සභාවේ ඇමතිවරු හා ප්‍රභූන් ද ගැහැණු ළමයින්ට අතවර කළ බව ඉතිහාසයේ දැක්වෙයි. මේ බව රාජාණ්ඩු පාලන සමයේ රූමත් ගැහැණු ළමයි රජුගේ හෝ මැති ඇමති වරුන්ගේ නෙත ගැටෙන්නට නොතැබීමෙන් තහවුරු වේ. එනම් රජතුමාට රූමත් තරුණියක් හෝ දැරිවියක් නෙත ගැටුණහොත් ඇයව අන්තඃපුරයට කැඳවීමට රාජ ආඥා නිකුත් කරන බැවිනි. එපමණක් නොව කාමයට වියරු වීමෙන් සල්ලාල

රජවරුන් පිරිහීමට පත්ව අවසානයේ ජනතාවගේ අප්‍රසාදයට පත්ව රාජ්‍යත්වයෙන් නෙරපීමට කටයුතු කළ අවස්ථාවන් තුළින් අණාවරණය වන්නේ ජනතාවගේ ආරක්ෂකයා වූ රජතුමා විසින් ළමයින් ලිංගික අතවර වලට ගොදුරු කරගත් බවය.(කුරේ,2005,28)

ලෝකයේ වෙනත් රටවල ද මෙම තත්වය පැවති හා පවතින බව විවිධ වාර්තා තුළින් පෙන්වා දිය හැකිය. තායිලන්තය, ඉන්දියාව, තායිවානය, මැලේසියාව, පකිස්තානය හා බංගලාදේශය ආදී ආසියා රටවල ළමයි ලිංගික අපයෝජනයන්ට ගොදුරු වෙයි. එසේම දකුණු ආසියා කලාපය ලිංගික කටයුතු සඳහා විදේශකයන් පැමිණීමට බලාපොරොත්තු වන ලෝකයේ පළමු ප්‍රදේශය වෙයි. තායිලන්තයේ ගණිකාවන් සම්බන්ධ තොරතුරු හා ගණිකාවන්ගේ ගණු දෙනු, අලෙවි කරන කඩ සාප්පු පවා ඇත.(නිශ්ශංක, 2004, 22). එසේම "ඒෂියා වීක් සඟරාව" පවසන පරිදි, තායිලන්තයේ ළමා ගණිකා ව්‍යාපාරයට ගොදුරු වන සංඛ්‍යාව ලක්ෂ හාරසියයකි. (රත්නපාල, 1997, 06)

දෙවන ලෝක යුද්ධයේ ආසන්නතම ප්‍රතිඵලයක් වශයෙන් 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nations Organization) පිහිටුවා ගන්නා ලද අතර, පසුව එහි මහා මණ්ඩලයේ දී 1989 නොවැම්බර් 20 දින සම්මත කරගත් ළමා හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශ්ව ප්‍රකාශනය ළමා අයිතීන් පිළිබඳව විශ්වීය පදනමක් දැමීමට කරන ලද ප්‍රධානතම උත්සාහය ලෙස දැකිය හැකිය. මෙම ප්‍රකාශයෙන් පසුව බොහෝ රටවල් තම අභ්‍යන්තර නීති පද්ධතියට නව නීති ස්ථාපිත කරමින් ළමයින්ට සිදුවන්නා වූ විවිධ අකටයුතුකම්, නොසලකා හැරීම් සම්බන්ධයෙන් නව නීති සකස් කරනු ලැබීය. ශ්‍රී ලංකාව 1991 දී එම සම්මුතියට අත්සන් තැබීමෙන් අනතුරුව ළමයින්ට බලපානු ලබන ක්ෂේත්‍රයන් ගණනාවකටම අදාලව නව නීති සම්පාදනය කරන්නට යෙදුණි.

එතැන් සිට වර්තමානය දක්වා විවිධ අවස්ථා වල ළමයින්ට එරෙහිව සිදු කරන ක්‍රියාවන් හෝ නොසළකා හැරීම් අපරාධමය වැරදි ලෙස ව්‍යවස්ථාපිත නීති පද්ධතියට හඳුන්වා දී ඇත. කුමන ආකාරයෙන් නීති සම්පාදනය වී තිබුණ ද ළමයින්ට එරෙහිව සිදුවන අපරාධවල පැහැදිලි


වෙනසක් සමාජයේ දක්නට නොලැබීම ළමා පරපුර මුහුණ දී ඇති හා ළමයින්ගේ ආරක්ෂාව සඳහා ස්ථාපිත කර ඇති ආයතන හා නිළධාරීන් මුහුණ දෙන ගැටලුවක් වේ.

1940 දශකය පමණ වන විට පීඩොෆීලියා (pedophilia) හෙවත් ළමයින් සම්බන්ධ ලිංගික ආශාව හා ළමා ලිංගික අපයෝජනය පිළිබඳව හඳුනා ගැනීමක් සිදුව නොතිබුණු අතර, සමලිංගිකත්වය පිළිබඳව ද අවම මට්ටමක දැනුමක් සමාජය තුළ පැවතුනි. එසේ වුවද මෙම අපරාධ සම්බන්ධව ඒවාට ගොදුරු වන ළමයින් පවා සැළකුවේ වැරදිකරුවන් මිස අපරාධ වින්දිතයන් ලෙස නොවේ.(ද සිල්වා, 2001, 226) මේ තුළින් පැහැදිලි වන්නේ අපරාධ කරුගේ ගොදුරක් බවට පත්වන ළමයාද වැරදිකරුවෙකු ලෙස සමාජය ඉදිරියේදී ලේබල් වූ ආකාරයයි.

ළමා අපයෝජනය ලෝකයේ එක් කලාපයකට, මහාද්වීපයකට, රටකට හෝ ප්‍රදේශයකට සීමා වූ වරදක් නොවන බව විශ්ව සංඛ්‍යා ලේඛන පරීක්ෂා කිරීම තුළින් පැහැදිලි වේ. ළමා ශ්‍රමය සූරාකෑම, ළමයින් නීති විරෝධී කටයුතු සඳහා යොදවා ගැනීම, කුට්ටනය කිරීම, සන්නද්ධ අරගල සඳහා යොදවා ගැනීම, ගණිකා සේවය හා අසභ්‍ය ඡායාරූප සඳහා ළමයින් යොදවා ගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල විසින් ප්‍රකාශයට පත්කර ඇති වාර්තාව අනුව දැකගත හැකිය.

ප්‍රස්තාර අංක 01

**කොන්දේසි විරහිත අන්ත තත්ත්වයන් යටතේ ළමා ශ්‍රමය සුරාකෑම (දහස් : 2000)**




(එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, 2006, 51)

මේ අනුව පැහැදිලි වන්නේ අපයෝජනයට ලක්වන මුළු ළමයින්ගේ ප්‍රමාණයෙන් අති බහුතර ප්‍රමාණයක් බලයෙන් හෝ බැඳුම්කාර තත්වයන් යටතේ ශ්‍රමිකයන් ලෙස යොදා ගන්නා බවයි. එමෙන්ම ඉහත සටහනට අනුව ලොව වෙසෙන ළමයින්ගෙන් දහස් 1800 ක් (සටහනෙහි දක්වා ඇත්තේ සංඛ්‍යාව දහස් වලිනි. එයින් දහස් 1 කින් 2000 ක් දැක්වෙයි.) ගණිකා සේවයේ හා අසභ්‍ය ඡායාරූප කරණය සඳහා යොදවා ගනිමින් ලිංගික වශයෙන් අපයෝජනයට ලක් කරන බව වාර්තා කරයි. එමෙන්ම වැඩිහිටියන්ගේ විවිධ අරමුණු සාක්‍ෂාත් කර ගැනීමේ පරමාර්ථ හා සන්නද්ධ අරගල සඳහා විවිධ අවශ්‍යතා වෙනුවෙන් ළමයින් යොදා ගැනීම, විවිධාකාර නීති විරෝධී කටයුතු සඳහා යොදවා ගැනීම, කුට්ටනය කිරීමට හසු වීමේ සංඛ්‍යා දත්ත වලින් ද පැහැදිලි වන්නේ ලොව සිටින ළමුන් ඉහත අපයෝජනයන් සඳහා ගොදුරු වීමේ තත්වයයි.


ළමා අපයෝජන සංඛ්‍යා දත්තයන් විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන්නේ ඒ අතරින් ළමා ශ්‍රමය යොදා ගැනීම පිළිබඳ වාර්තා ඉතා ඉහළ අගයක් ගන්නා බවයි. මෙම වරද පිළිබඳව තව

දුරටත් විග්‍රහ කිරීමේදී ළමා ශ්‍රමය අනිසි ලෙස යොදා ගැනීම ලෝකයේ සෑම කලාපයකම පොදුවේ සිදු කරනු ලබන අපයෝජනයක් ලෙස හඳුනාගත හැකිය.

**ප්‍රස්තාර අංක 02**

## සංවර්ධනය වෙමින් පවතින රටවල ළමා ශ්‍රමය

**(ළමා ශ්‍රම කටයුතු වල යෙදී ඇති අවුරුදු 5-14 ළමයින්ගේ ප්‍රතිශතය 1999-2004)**




(එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල, 2006, 51)

මේ තුළින් පැහැදිලි වන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් අයත් අප්‍රිකානු කලාපය හා අවම සංවර්ධිත රටවල් තුළ ළමා ශ්‍රමය අනිසි භාවිතය, එනම් අවුරුදු 05 - 14 ත් අතර ළමයින්ගේ ශ්‍රමය සූරාකෑම ඉතා ඉහළ අගයක් ගන්නා බවයි. එමෙන්ම දකුණු ආසියාව හා නැගෙනහිර ආසියාතික රටවල ද ළමා ශ්‍රම භාවිතය සිදුවන අතර, ළමා නීති හා ප්‍රඥප්ති සකසමින් ළමයින්ගේ ආරක්ෂාව පිළිබඳ සෙසු රටවලට ද බලපෑම් කරන සංවර්ධිත රටවල ද ළමා ශ්‍රමය අනිසි ලෙස යොදා ගැනීම පාලනය කරගත නොහැකි වී ඇති අයුරු ඉහත ප්‍රස්ථාරය මගින්